මධ්‍යම සංස්කෘතික අරමුදල

மத்திய கலாசார நிதியம்

CENTRAL CULTURAL FUND

වාර්ෂික වාර්තාව
ஆண்ட றிக்கை
ANNUAL REPORT

2011

ශ්‍රී ලංකාවේ ශ්‍රී විභූතිය
රැකගැනීමට අත දෙන්න

මධ්‍යම සංස්කෘතික අරමුදල

மத்திய கலாசார நிதியம்

CENTRAL CULTURAL FUND

ශ්‍රී ලංකාවේ ශ්‍රී විභූතිය
රැකගැනීමට අත දෙන්න

වාර්ෂික වාර්තාව

ஆண்ட றிக்கை

ANNUAL REPORT 2011

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

පටුන පිටුව

01	මධ්‍යම සංස්කෘතික අරමුදලේ තිස්වන වාර්ෂික වාර්තාව - 2011	1 - 18
02.	2011 දෙසැම්බර් 31 වනදායින් අවසන් වර්ෂයේ මධ්‍යම සංස්කෘතික අරමුදලේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව	19 - 30
03.	මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2011 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන්වූ වර්ෂයේ ශේෂ පත්‍රය	31 - 34

உள்ளடக்கம் பக்கம்

01.	மத்திய கலாசார நிதியத்தின் பதினெட்டாவதுவருடாந்த அறிக்கை – 2011	35 - 53
02.	2011 டிசெம்பர் மாதம் 31 ஆம் திகதியுடன் முடிவடைந்த ஆணடின் மத்திய கலாசார நிதியத்தின் கணக்குகள் பற்றிய கணக்காய்வாளர் நாயகரின் அறிக்கை	54 - 68
03	மத்திய கலாசார நிதியம் - 2011 டிசெம்பர 31 ஆம் திகதியுடன் முடிவடைந்த ஆண்டிற்கான வருமான செலவினக் கணக்குகள்	69 - 72

CONTENTS PAGE

01.	Thirty Annual Report of the Central Cultural Fund - 2011	73 - 89
02.	The Report of the Auditor General on the Accounts of the Central Cultural Fund for the year ended 31st December 2011	90 - 102
03.	Balance Sheet of the Central Cultural Fund as at 31st December 2011	103 - 106

මධ්‍යම සංස්කෘතික අරමුදලේ තිස්වන වාර්ෂික වාර්තාව - 2011

පාලක මණ්ඩලය

2011 වර්ෂයට අදාළ මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩලය.

පාලක මණ්ඩලයේ සභාපති
අග්‍රාමාත්‍ය ගරු දි.මු. ජයරත්න මැතිතුමා

ගරු ටී.බී. ඒකනායක මැතිතුමා
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍ය

ගරු ගීතාංජන ගුණවර්ධන මැතිතුමා
නියෝජ්‍ය මුදල් අමාත්‍ය

ගරු එස්. අමරසේකර මහතා
අග්‍රාමාත්‍ය ලේකම්

බැසිල් රාජපක්ෂ මැතිතුමා
ආර්ථික සංවර්ධන අමාත්‍ය

ආචාර්ය ජගත් බාලසූරිය මැතිතුමා
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය

විමල් රූබසිංහ මහතා
ලේකම්,
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

ඩබ්.ජේ. රණවීර මහතා
ක්‍රියාකාරී අධ්‍යක්ෂ
මධ්‍යම සංස්කෘතික අරමුදල

ආචාර්ය සෙනරත් දිසානායක මහතා
අධ්‍යක්ෂ ජනරාල්
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

එන්. ගොඩකන්ද මහත්මිය
අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

උපාලි කිරිඳිගොඩ මහතා
සාමාජික

වසරේ භෞතික ප්‍රගතිය

මධ්‍යම සංස්කෘතික අරමුදල පිහිටුවීමේ එක් ප්‍රධාන පරමාර්ථයක් වනුයේ ශ්‍රී ලංකාවේ ඇති පුරාවස්තු සංවර්ධනය කොට සංරක්ෂණය කිරීමයි. මේ යටතේ අභයගිරිය හා ජේතවන ස්තූප සංරක්ෂණ කටයුතු ඉතා වැදගත්කමක් හා විශාල වියදමක් දැරූ ව්‍යාපෘති වේ. මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් දැනට ආරම්භ කොට පවත්වාගෙන යන ව්‍යාපෘති වනුයේ,

- අභයගිරිය
- ජේතවනය
- සීගිරිය
- පොළොන්නරුව
- මහනුවර
- වයඹ සංස්කෘතික චතුරශ්‍ර ව්‍යාපෘතිය (යාපහුව, දඹදෙණිය, පඬුවස්නුවර, කුරුණෑගල)
- රුහුණු සංස්කෘතික කලාපය

වසරේ මූල්‍ය ප්‍රගතිය

මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩල රැස්වීම් 2011 වසර තුළ දී පවත්වන ලද අතර මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්යයන්ට අදාළ ප්‍රතිපත්තිමය තීරණ හා අවශ්‍ය මාර්ගෝපදේශයන් පාලක මණ්ඩලය විසින් තීරණය කර එකී උපදෙස් හා නියමයන්ට අනුව අදාළ කාර්යයන් ක්‍රියාත්මක කර ඇත.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2011 වර්ෂය තුළ දී බලාපොරොත්තු වූ ප්‍රවේශපත් ආදායම රුපියල් මිලියන 800 ක් වූ අතර 2011 වර්ෂය තුළ දී උපයාගත් ආදායම රුපියල් මිලියන 1027 ක් විය. ඒ අනුව ඉලක්කගත ප්‍රවේශපත්‍ර ආදායම ඊට වඩා 57.73% ඉහළ වර්ධනයක් පෙන්නුම් කරන ලදි. මහා භාණ්ඩාගාරයෙන් රුපියල්

මිලියන 25.0 ක ප්‍රදානයක් ලැබුණි. ඉහත ප්‍රවේශ පත්‍ර ආදායම හැර වක්‍ර ආදායම වශයෙන් රුපියල් මිලියන 21.10 ක් අපේක්ෂා කරන ලදී.

අපේක්ෂිත ආදායමට වඩා 2011 වසර තුලදී රුපියල් මිලියන 241.1 ලැබී තිබුණි. මෙයට රජයේ අනුග්‍රහය වශයෙන් රුපියල් මිලියන 55.0 ක ප්‍රතිපාදන ද ඇතුළත් ය.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන අරමුණ වන ස්මාරක සංරක්ෂණය සහ පුරාවිද්‍යාත්මක කැණීම් කටයුතු වලට අදාළ සංවර්ධන සැලසුම් සඳහා අපේක්ෂිත පරිදි මුදල් වැය කිරීමට වර්ෂය තුලදී ක්‍රියා මාර්ග ගනන ඇත. මේ සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 633.7 කි.

පුරාවස්තු සංරක්ෂණ කටයුතු සඳහා වැය වන මුදල් සඳහා ආදායම් ප්‍රභවයන්

මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වනුයේ සීගිරිය, පොළොන්නරුව, අනුරාධපුරය යන ව්‍යාපෘති නැරඹීම වෙනුවෙන් සංචාරකයින්ගෙන් අයකරන ටිකට්පත් ආදායමයි. මෙම ටිකට් අලෙවි කටයුතු වලින් පසුගිය කාල පරිච්ඡේදය තුළ ලැබූ ආදායම පහත පරිදිං වේ.

වර්ෂය	ආදායම	වර්ධනය %
2009	422,901,847	-
2010	764,622,361	44
2011	1,027,218,619	25

මේ අනුව 2009 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේ දී ආදායම් උපයාගැනීම 300% ක් පමණ වැඩි කර ගැනීමට අපට හැකි වී ඇත. මීට ප්‍රධාන හේතුව වූයේ නූතන තාක්ෂණය යොදා ගනිමින් ටිකට් අලෙවි ක්‍රමවේදයේ යහපත් අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දීමයි.

මෙම තත්ත්වය වඩාත් තහවුරු කර ගැනීම සඳහා ලංකාවට පැමිණි සංචාරකයින්ගේ වර්ධනය 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා පහත පරිදි වේ.

වර්ෂය	ලංකාවට පැමිණි සංචාරකයින්ගේ ප්‍රමාණය
2009	447,890
2010	654,476
2011	855,955

මේ අනුව 2009 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේ දී ලංකාවට පැමිණි සංචාරකයින්ගේ වර්ධනය දෙගුණයකින් වැඩි වී ඇති බව පැහැදිළි වන අතර, අපගේ ආදායම තුන් ගුණයකින් වැඩි වීම මත අප විසින් ටිකට් අලෙවි ආදායම් කටයුතු සාර්ථකව පවත්වාගෙන ගොස් ඇති බව තහවුරු වේ. එලෙසම 2010 හා 2011 වර්ෂවල ඒ ඒ මාසවල ටිකට් අලෙවි ආදායම්වල ප්‍රගතිය මීට අමුණා ඉදිරිපත් කරන වගුවෙන් වඩාත් පැහැදිළි වනු ඇත.

මධ්‍යම සංස්කෘතික අරමුදල

දැක්ම

"ශ්‍රී ලංකාවේ අතීත ශ්‍රී විභූතිය අනාගත පරපුර වෙනුවෙන් රැකගැනීම".

මෙහෙවර

ශ්‍රී ලංකාවේ ජතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම හා ප්‍රවර්ධනය මගින් ලාංකික සමාජ සංස්කෘතිය හා ආර්ථික සංවර්ධනයට උරදීම,

අරමුණ

ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා ආගමික ස්මාරක සංවර්ධනය කිරීම, සංරක්ෂණය කිරීම හා කැණීම් කිරීම සඳහාද අරමුදල් සැපයීම සහ විද්ශයන්හි හා ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික කටයුතු සංවර්ධනය කිරීමේදී දරන ලද වියදම් පියවීම පිණිසද කලාකරුවන්ට, ශිල්පීන්ට, ලේඛකයන්ට, චිත්‍ර ශිල්පීන්ට, සංගීතඥයින්ට සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහි ලා නිරත වන වෙනත් තැනැත්තන්ට මුදලින් ආධාර සැලසීම පිණිසද සංස්කෘතික හා ආගමික ක්ෂේත්‍රයන්හි ජාතිය වෙනුවෙන් සේවය කළ තැනැත්තන්ට ප්‍රදානය කිරීම සඳහාද අරමුදලේ ප්‍රතිපාදන වෙන් කිරීම සඳහාද ඊට සම්බන්ධ හෝ අනුසාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩලය

1980 අංක 57 දරණ මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත අනුව සංස්කෘතික කටයුතු විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරී වශයෙන් කටයුතු කරනු ලබයි. ආයතන ප්‍රධානියා වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් කටයුතු කරනු ලබන අතර, මධ්‍යම සංස්කෘතික අරමුදලේ සමස්ථ කාර්ය භාරය සංවර්ධන, පාලන සහ මුදල් වශයෙන් ප්‍රධාන අංශ තුනක් යටතේ විෂයභාර අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගේ මෙහෙයවීමෙන් සිදු කර ගෙන යනු ලබයි.

මෙම කාර්ය භාරය ඉටුකර ගෙන යාම සඳහා පහත සඳහන් කාර්ය මණ්ඩලය වසර තුළදී සේවයේ යොදවා ගන්නා ලදි.

කළමනාකරණ මට්ටමේ නිළධාරීන්	11
කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිළධාරීන්	34
පුරාවිද්‍යා පර්යේෂණ නිළධාරීන්	60
සංරක්ෂණ නිළධාරීන්	47
බිතුසිතුවම් සංරක්ෂක නිළධාරීන්	21
ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවලට අදාළ නිළධාරීන්	218
කම්කරු ශ්‍රේණිවලට අදාළ සේවකයින්	1499
අනියම් පදනමින් සේවයේ යොදවා ගත් සේවකයින්	172
	2062

මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන ව්‍යාපෘති

1. අභයගිරිය ව්‍යාපෘතිය
2. ජේතවන ව්‍යාපෘතිය
3. පොළොන්නරුව ව්‍යාපෘතිය
4. සීගිරිය ව්‍යාපෘතිය
5. මහනුවර ව්‍යාපෘතිය
6. රම්බා විහාර ව්‍යාපෘතිය
7. තිස්සමහාරාම ව්‍යාපෘතිය
8. ගාල්ල කොටුව ව්‍යාපෘතිය
9. යාපහුව ව්‍යපෘතිය
10. දඹදෙණිය ව්‍යාපෘතිය
11. පඬුවස්නුවර ව්‍යාපෘතිය
12. රිදී විහාර වැඩබිම

විශේෂ ව්‍යාපෘති

1. බටලීය කෞතුකවස්තු අනුරූ නිකේතනය
2. ප්‍රකාශන, මුද්‍රණ හා ප්‍රචාරක අංශය
3. සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය, ගාල්ල
4. මුහුදු පුරාවිද්‍යා ඒකකය, ගාල්ල

2011 වර්ෂයේ කැණීම් හා සංරක්ෂණ කටයුතු වල භෞතික ප්‍රගතිය

2011 දීර්ඝ කාලයකට පසුව සතුටුදායක භෞතික ප්‍රගතියක් වාර්තා කළ වසරකි. 2010 වර්ෂයේ සිට මූල්‍ය තත්ත්වය යහපත් වුවද භෞතික සම්පත් කළමනාකරණය කරමින් ඉලක්ක ළඟා කර ගැනීම අරමුණු කරගත් සංවර්ධන සැලැස්මක් නියමිතව ක්‍රියාත්මක කර ගැනීමට හැකි වූයේ 2011 වසරේදීය.

ඒ අනුව 2011 වර්ෂයේ ප්‍රධාන ව්‍යාපෘති 9 ක් යටතේ වැඩබිම් 141 ක් ක්‍රියාත්මක වූ අතර මින් 21 ක්ම අවසාන කිරීමට හැකි වීම විශේෂිතය. වසරේ ඍජු වියදම සඳහා රු. මිලියන 359.6 ක් ඇස්තමේන්තු කර තිබූ අතර, මින් රු. මිලියන 220.1ක් (61.2%) වියදම් කර තිබුණි. මිනිස් දින 198, 855 ක් යොදා වැඩ ඒකක 104, 889.51 ක් අවසාන කිරීමට හැකි වූ අතර, එය 65.88% ක් ලෙෂ වෙනත් වසර වලට වඩා කැපී පෙනෙන ප්‍රගතියක් විය. වසර පුරාම 88% ක කාර්යක්ෂමතාවයක්ද පවත්වා ගෙන ගොස් තිබේ.

අභයගිරිය ව්‍යාපෘතිය

කැණීම් හා පුරාවිද්‍යා පර්යේෂණ

මේ යටතේ ක්‍රියාත්මක වූ ථූපාරාම සංකීර්ණයේ දකුණුපස බැමි, ථූපාරාම බෝධිඝරය, ථූපාරාමයේ නැගෙනහිර ප්‍රවේශ දොරටුව හා සඳකඩ පහණ අසළ කැණීම් අවසාන කිරීමට හැකි විය. මීට අමතරව ථූපාරාමයේ භූ දර්ශණ සඳහා කැණීම්, කුට්ටම් පොකුණ අසළ පැරණි ගොඩනැගිලි හා මහාවිහාරයේ ස්මාරක වාර්තා කරණය ක්‍රියාත්මක විය. දෛනිකව පවත්වාගෙන යායුතු කෞතුකාගාරය, පර්යේෂණ හා ප්‍රකාශන, රසායනාගාරයද වසර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. වසර අවසාන වන විට 68.7% ක භෞතික ප්‍රගතියක් ළඟා කර ගෙන ඇති අතර රු. මිලියන 7.35 (64.8%) ක් වැය කර ඇත.

සංරක්ෂණ හා භූ දර්ශණ

අභයගිරය ස්තූපයේ සංරක්ෂණ කටයුතු අවසාන කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දී ඇත. කොත් කැරැල්ල සම්පූර්ණයෙන් අවසාන කර ඇති අතර, හතරැස් කොටුවේ ඉතා සුළු වැඩ ප්‍රමාණක් ඉතිරි වී ඇත. හතරැස් කොටුවේ සංරක්ෂණ කාර්යය නිමා වූ විට ස්තූප ඇතුළු ප්‍රාකාරයත්, සලපතල මළුවේත් සංරක්ෂණ කාර්යය ආරම්භ කිරීමට යෝජනා වූ නමුත්, ඔක්තෝබර් මාසයේදීම සලපතල මළුවේ සංරක්ෂණය ආරම්භ කිරීමට හැකි විය.අභයගිරිය ස්තූප ගර්භයේ සංරක්ෂණ කටයුතු සීඝ්‍රයෙන් සිදු කෙරෙමින් පවතින අතර, වසර අවසාන වන විට 80% ක වැඩ ප්‍රමාණයක් නිම කිරීමට හැකි විය. මෙම කාර්යය 2012 වසරේදී අවසාන කිරීමට නියමිතය.

අභයගිරිය ස්තූපයේ සංරක්ෂණ කටයුතු

ස්තූප වැඩබිම් වලට අමතරව ථූපාරාම සංකීර්ණයේ පිට පවුර සංරක්ෂණය සඳහාද විශාප අවධානයක් ලබා දී ඇත. මේ වසර අවසාන වන විට ප්‍රාකාරයේ ගඩොල් වැඩ පමණක් ඉතුරු වී ඇති අතර ගඩොල් සපයා ගැනීමේ දුෂ්කරතා නොවන්නට එම කාර්යයද අවසන් කළ හැකිව තිබුණි. ථූපාරාම බෝධිඝරයේ සංරක්ෂණ කටයුතු අවසන් කරන ලදි.

අභයගිරිය හා මහා විහාර පරිශ්‍රයේ දෛනික නඩත්තු කටයුතු ද නොකඩවා සිදුකරන ලදි.

ජේතවන ව්‍යාපෘතිය

කැණීම් හා පුරාවිද්‍යා පර්යේෂණ

මේ යටතේ විද්‍යාත්මක හා පර්යේෂණ හා විශ්ලේෂණ කටයුතු සිදු කෙරේ. පැරණි මානව වාස භූමි පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා සිදුකළ පර්යේෂණ කැණීම අවසාන කරන ලද අතර වාර්තාව සම්පාදනය කිරීමට නියමිතය. පුරාවිද්‍යා පර්යේෂණ හා දත්ත රැස්කිරීම, වාර්තා සකස් කිරීම, කෞතුකාගාරය පාලනය හා නරඹන්නන් දැනුවත් කිරිම, රසානාගාරය, පුරාවස්තු විශ්ලේෂණය යන දෛනික ක්‍රියාකාරකම්ද අඛණ්ඩව සිදු කෙරිණි. පුරාවිද්‍යා වාර්ෂික වාර්තාව අවසන් කරන ලදි.

සංරක්ෂණ හා භූ දර්ශන කටයුතු

පැරණි ආරාම ප්‍රතිසංස්කරණ කටයුතු මූලික වශයෙන් සිදු කෙරෙන අතර, ව්‍යාපෘති කෞතුකාගාරය ඇතුළු ගොඩනැගිලි කීපයක් ප්‍රතිසංස්කරණය කරන ලදි. ජේතවන ස්ථූපයේ ආරක්ෂාවට අත්‍යවශ්‍යයෙන්ම කළ යුතුව තිබූ හතරැස් කොටුව පාමුල සිට මීටර් 5 ක් පමණ පහළට නැවත බදාම යෙදීමද සිදු කරන ලදි.

මීට අමතරව රන්වැට අරමුදල් මඟින් ශ්‍රී මහා බෝධිය අවට වැඩි දියුණු කිරීම් රාශියක් නිම කරන ලද අතර, පැරණි ගල් ප්‍රාකාරයේ සංරක්ෂණ කටයුතුද අඛණ්ඩව සිදු කරන ලදි. 2012 දී අවසන් කිරීමට නියමිතව ඇති මෙම කාර්යයන් අඩකට වඩා දැනට නිම කර ඇත.

මීට අමතරව ව්‍යාපෘති භූමිය නඩත්තු කටයුතු වසර පුරා අඛණ්ඩව සිදු කෙරිණි. අභයගිරිය ස්තූපයේ සංරක්ෂණ කටයුතු සඳහා කම්කරුවන් යොමු කිරීකම ව්‍යාපෘතියේ කාර්යයන් අඩාල වීමට හේතු විය.

පොළොන්නරුව ව්‍යාපෘතිය

කැණීම් හා පුරාවිද්‍යා පර්යේෂණ

ප්‍රධාන වශයෙන් පර්යේෂණාත්මක කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබා දී ඇත. පුරා විද්‍යා කැණීම් වලින් හමුවූ පුරාවස්තු, ශිලා ලිපි හා ස්මාරක නටඹුන් අධ්‍යයනය කර ශ්‍රී ලංකාවේ මධ්‍යකාලීන ඉතිහාසය පිළිබඳ දැනුම යාවත්කාලීන කෙරේ. කෞතුකාගාරය, පුස්තකාලය, රසායනාගාරය හා මාසික දේශන මාලාව අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ.

සංරක්ෂණ හා භූ දර්ශන

කිරිවෙහෙර සංරක්ෂණය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලද අතර 2011 නොවැම්බර් මාසයේ දී එම කාර්යය අවසන් කෙරිණි. දීර්ඝ කාලයකට පසුව පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු විශාල චෛත්‍යයක හුණු පිරියම් කර සංරක්ෂණය අවසන් කළ ප්‍රථම අවස්ථාව මෙයයි. ආයත සංරක්ෂණය ද ආරම්භ කර ඇති අතර, ඒවා ලබන වසරේදී අවසන් කිරීමට නියමිතය.

පොළොන්නරුව කිරිවෙහෙර සංරක්ෂණ කටයුතු

සංචාරක අව ව්‍යුහ පහසුකම් දියුණු කිරීමද 2011 වසරේදී ක්‍රියාත්මක විය. මේ යටතේ පුරාවිද්‍යා භූමිය තුළ මාවත් ගඩොල් ඇතිරීම, රථ ගාල සංවර්ධනය, වෙළඳ කුටි ක්‍රමවත්ව ඉදිකිරීම, ආදිත්‍ය නේවාසිකය වැඩි දියුණු කිරීම ආදිය සිදු කෙරිණි. මුලින් යෝජනා වූ පරිදි මාවත් ගඩොල් ඇතිරීම පර්යේෂණාත්මක මට්ටමින් කිලෝමීටර 1 ක් දුරට සිදු කළ අතර, ප්‍රායෝගික හේතු මත එම මාවත් දුඹුරු පැහැති කොන්ක්‍රීට් ගල් අතුරා සකස් කිරීමට වසර අවසානයේදී තීරණය කෙරුණි.

මීට අමතරව ලංකාතිලක පිළිම ගෙය, විජයබාහු මාළිගය, පැරණි බදාම සංරක්ෂණය හා පුරාවිද්‍යා භූමයේ නඩත්තු, උද්‍යාන අලංකරණ කටයුතු ද සිදු කෙරිණි.

සීගිරිය / දඹුල්ල ව්‍යාපෘතිය

කැණීම් හා පුරාවිද්‍යා පර්යේෂණ

පුරාවිද්‍යා රක්ෂිතයේ ඊසාන දිග ප්‍රදේශය සිතියම් ගත කිරීම හා පහන් ගල ආශ්‍රිත පර්යේෂණ කැණීම් අවසන් කර ඇත. ඉහළ කලවැල්ල උල්පොත ගවේෂණ කටයුතුද, එහි පර්යේෂණ කැණීමක්ද සිදු කරන ලදි. ව්‍යාපෘතියේ කැණීම් කටයුතු වලින් පුරාවස්තු, ශිලා ලේඛන හා බිතු සිතුවම් අධ්‍යයනය, වාර්තා කිරීම, විශ්ලේෂණය, පුරාවිද්‍යා දත්ත ගබඩාව කිරීමද, නව කෞතුකාගාරයේ පුරාවස්තු ප්‍රදර්ශන, නරඹන්නන් දැනුවත් කිරීම, දේශන, පුරාවස්තු නියාමනය ආදී දෛනිකව ක්‍රියාත්මක වන කාර්යයන්ද සිදු කරන ලදි. කෞතුකාගාරයේ මහජන සම්බන්ධතා යටතේ සංචාරකයන් ආකර්ශණය කර ගැනීම සඳහා පැරණි ලාංකික යටතේ සටන් ක්‍රමයක් වන අංගම් පොර සංදර්ශනයක්ද අගෝස්තු මාසයේ පවත්වන ලදි.

සංරක්ෂණ හා භූ දර්ශන

කැටපත් පවුර පැරණි බඳාම සංරක්ෂණය අවසන් කර ඇත. ගල මුදුන දකුණ හා නැගෙනහිර බැම්, සිංහපාද මළුවේ නැගෙනහිර හා බටහිර බැවුම්වල සංරක්ෂණ කටයුතු සැප්තැම්බර් මාසය දක්වා ක්‍රියාත්මක වුවද, ගඩොල් හා සංරක්ෂණ ද්‍රව්‍ය ඉහළට ප්‍රවාහනය කර ගැනීමේ දුෂ්කරතා නිසා අත්හිටුවීමට සිදුවිය. නමුත් ශ්‍රමදාන මගින් අවශ්‍ය ද්‍රව්‍ය ගල මුදුනට ප්‍රවාහනය කිරීම ඔක්තෝම්බර් මාසයේ සිට සිදු කළ අතර, ඉන්පසු නැවත සංරක්ෂණ කටයුතු ඇරඹීමට නියමිතය.

උද්‍යාන අලංකරණ කටයුතු හා ජල උද්‍යානයේ පැරණි බැම් නඩත්තුවද අඛණ්ඩව ක්‍රියාත්මක විය. ජල උද්‍යානයේ නිරිත දිග ප්‍රදේශයේ ඇති පොකුණ සංරක්ෂණය අවසන් කරන ලදි. පරිසර සංචරණය හා සංචාරකයන් ආකර්ශණය කර ගැනීමේ අපේක්ෂාවෙන් අප්සරා සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීමට යෝජිත අතර එයට අවශ්‍ය වාස්තු විද්‍යා සැලසුම් සකස් කිරීම සිදු කෙරේ.

දඹුල්ල වැඩබිම

දැඹව හා මහවැහැර පන්සල්වල චිත්‍ර සංරක්ෂණය අවසන් කරන ලදි. තලකිරියාගම චිත්‍ර සංරක්ෂණයද අවසන් අදිරියට ළඟා වෙමින් පවතී.

බිතුසිතුවම් කෞතුකාගාරයේ මහජන ප්‍රදර්ශන, නඩත්තු ආදී දෛනික කටයුතු අඛණ්ඩව සිදු කරන අතර සංරක්ෂිත චිත්‍රවල තත්ත්ව පරීක්ෂාව හා නියාමනයද කෙරේ.

මහනුවර ව්‍යාපෘතිය

කැණීම් හා පර්යේෂණ

පුරාවිද්‍යා ගවේෂණ යටතේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සාම්ප්‍රදායික ශිල්ප පිළිබඳ ගවේෂණය, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව සතුව ඇති මහනුවර ඉපැරණි ස්මාරක පිළිබඳ ලේඛන පරිශීලනය කර දත්ත රැස්කිරීම හා පාසල් ශිෂ්‍යයන් ඇතුළු වෙනත් සංචාරක කණ්ඩායම් සඳහා දැනුවත් කිරීමේ දේශණ ද පැවැත්වීම සිදුවේ.

සංරක්ෂණ හා භූ දර්ශණ

මකුලේතැන්න රජමහා විහාරයේ බණ මඩුව, පිළිමගෙය හා පුස්තකාලයේ සංරක්ෂණ කටයුතු අවසන් කරන ලදි. සෙල්ලාවලි රජමහා විහාරයේ යෝජිත වැඩ කොටස් සියල්ලම අවසන් කර ඇති නමුත් අමතරව එකතු වූ කාර්යයන් කීපයක් තව දුරටත් සිදු කෙරේ.

අත්තරගම රජමහා විහාරයේ ස්ථූපය තුළට වැඩී තිබූ ශාක ඉවත්කර කපරාරු කරන ලද අතර, විහාරගේ වරින් වර සිදු කෙරුණු ප්‍රතිසංස්කරණ වලදී හුණු ආලේපන මගින් වැසී තිබුණ පැරණි කැටයම් මතු කිරීම ද සිදු කරන ලදි. බුළුගහතැන්න රජමහා විහාරයේ වහළ කොටස හැර ඉතිරි කාර්යයන් අවසාන කර ඇත.

ලෝක උරුම නගරයේ ඓතිහාසික වාස්තු විද්‍යාත්මක ආකෘතියට හානියක් නොවන පරිදි මහනුවර නගරයේ නව ගොඩනැගිලි සඳහා අදාළ සැලසුම් සකස් කිරීම, පැරණි වීදි දර්ශණ පිළිබඳ තොරතුරු ලබා දීමත්, වෙනස්වීම් නියාමනය හා වාර්තාකරණය යන කාර්යයන් ලෝක උරුම ඒකකය මගින් වසර පුරා ක්‍රියාත්මක කෙරිණි.

ගනේගෙදර රජමහා විහාරය, මැණික්හින්න පොතුගල් විහාරය හා රත්මලාන ශ්‍රී පුෂ්පාරාමය යන විහාරස්ථාන වල බිතු සිතුවම් සංරක්ෂණය අවසන් කරන ලදි. කන්දෙපිටිය ටැම්පිට විහාරයේ චිත්‍ර සංරක්ෂණය නොවැම්බර් මාසයේදී ආරම්භ කළ අතර, සංරක්ෂිත චිත්‍ර සහිත විහාරස්ථාන නියාමනය කිරීමද අඛණ්ඩව සිදුකරන ලදි.

රම්බා විහාර ව්‍යාපෘතිය

කැණීම් හා පර්යේෂණ

මේ යටතේ මූලිකව පර්යේෂණ හා පුරාවස්තු විශ්ලේෂණය සිදුකෙරෙන අතර, අංක 21 ආරාම සංකීර්ණයේ භූ දර්ශන සකස් කිරීම සඳහා පස් ඉවත් කිරීම සිදු කරන ලදි. අවශ්‍ය පමණ කම්කරුවන සොයාගැනීම දුෂ්කර වූ බැවින් යෝජිත වැඩබිම් කීපයක් ආරම්භ කිරීමට නොහැකි විය. පුරාවස්තු විශ්ලේෂණය, වාර්තාගත කිරීම රසායනාගාරය මඟින් ඉටු කරනු ලැබිණි.

සංරක්ෂණ හා භූ දර්ශණ

අංක 21 සංකීර්ණයේ පිට පවුර සහ වෙනත් පැරණි ගඩොල් බැම් සංරක්ෂණය බොහෝ දුරට අවසන්ව ඇත. පිට පවුරේ සමහර කොටස් පෞද්ගලික දේපළ තුළ දිවෙන බැවින් කැණීම් හා සංරක්ෂණය කරනුයේ ව්‍යාපෘති භූමියට අයත් කොටස් වල පමණි. ඉතිරි සංරක්ෂණ කටයුතු නිම කිරීමට අදාළ ඉඩම් හිමිකරරුවන් සමඟ සාකච්ඡා කළ යුතුය.

රම්බා විහාරය සඳහා අවශ්‍යව පවතින සංඝාවාසය ඉදිකිරීමේ කටයුතු නොවැම්බර් මාසයේදී ආරම්භ කරන ලදි. කොන්ත්‍රාත් පදනමින් කෙරෙන මෙම කාර්යයේ අත්තිවාරම කයිරු බැම්ම මට්ටම දක්වා අවසන් කර ඇත.

ව්‍යාපෘතියේ අව ව්‍යුහ පහසුකම් දියුණු කිරීම යටතේ වැසිකිළි පද්ධතියක් ඉදිකිරීමද ආරම්භ කළ අතර වසර අවසාන වන විට 75% ක් පමණ අවසන් කල හැකි විය.

තිස්සමහාරාම ව්‍යාපෘතිය

කැණීම් හා පර්යේෂණ

ප්‍රදේශයේ පැරණි මානව ජනාවාස පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා අකුරුගොඩ ආරම්භ කර ඇති පර්යේෂණ කැණීම් වසර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක විය. දැනට පොළව මතුපිට සිට මීටර් 6 ක් පමණ ගැඹුරෙහි පස් ස්ථර අධ්‍යයනය හා සාම්පල රැස් කිරීම සිදුකෙරේ. එමෙන්ම මෙතෙක් ලැබී ඇති පුරාවස්තු විශ්ලේෂණය, සංරක්ෂණය හා ලේඛනගත කිරීමද ක්‍රමවත්ව සිදුකෙරේ.

සංරක්ෂණ හා භූ දර්ශණ

සඳගිරිය ස්ථූපය සංරක්ෂණය සඳහා ප්‍රමුඛතාවය ලබා දී ඇත. මීටර් 17 ක් පමණ උසැති මෙම පැරණි ස්ථූපයේ ගඩොල් සංරක්ෂණය අවසාන කරන ලදි. නමුත් ස්ථූපයේ ගර්භයට ඉහළ කොටස පිළිබඳව නිශ්චිත තීරණයකට එළඹීමට පුරා විද්‍යා උපදේශක සභාවට යොමුකර ඇත. මෙහි පැරණි ඡත්‍රයේ කොටස් ප්‍රතිසංස්කරණය කර ඡත්‍රය සවි කිරීම හෝ ගර්භයේ මුදුන තෙක් පමණක් සංරක්ෂණය කිරීම පිළිබඳව තීරණය අපේක්ෂා කෙරේ. ස්ථූපයේ ඇතුළු ප්‍රාකාරය හා වැලි මළුව සංරක්ෂණය ද ආරම්භ කර ඇත. ස්ථූපයේ කුස්තුර වැඩ අවසාන වූ පසු කම්කරු ප්‍රමාණය වැඩි කරමින් ඇතුළු ප්‍රාකාරයත්, වැලි මළුවත් සංරක්ෂණය අවසන් කිරීමට අපේක්ෂිතය.

කතරගම කෞතුකාගාරයෙත් සංචාරක නිවාසයත් මෙම ව්‍යාපෘතිය යටතේ පාලනය වේ. ව්‍යාපෘති භූමියේ නඩත්තුව අඛණ්ඩව සිදු කරන ලදි.

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළ මැද මුලන බෝධිමළු විහාරයේ වාහල්කඩ ඉදිකිරීම අවසාන කරන ලදි.

ගාල්ල කොටුව ව්‍යාපෘතිය

කැණීම් හා පර්යේෂණ

මේ යටතේ මුහුදු පුරාවිද්‍යා ගවේෂණ හා පුරාවස්තු සංරක්ෂණය සිදුකෙරේ. 2011 දෙවන කාර්තුව තුළ මධ්‍යම සංස්කෘතික අරමුදලේ මුහුදු පුරා විද්‍යා ඒකකය වයඹ දිග වෙරළේ සහ නොගැඹුරු මුහුදේ ගවේෂණ කටයුතු සිදුකරන ලදි. එම ප්‍රදේශයේ ගිලී ඇති නෞකා පිළිබඳව අධ්‍යයනය කිරීම අරමුණයි. මීට අමතරව ගාලු වරායේ ෂල නල ණල ජල ෲ සහ ඹ යන වැඩ බිම්වල ස්ථානීය සංරක්ෂණ කටයුතුද, තව දුරටත් ගවේෂණද සිදුකරන ලදි.

මුහුදු පුරාවිද්‍යා කෞතුකාගාරයේ දෛනික කටයුතුද, ශිෂ්‍ය වැඩ සටහන්, ප්‍රදර්ශන ආදියද ක්‍රියාත්මක විය.

සංරක්ෂණ හා භූ දර්ශන

මේ යටතේ බලපිටිය ගරුමුණි වලව්වේ වහලයේ හදිසි සංරක්ෂණ කටයුතු හා ඕලන්ද ගබඩා ගොඩනැගිල්ලේ කපරාරු සංරක්ෂණය සිදු කරන ලද අතර, එම කාර්යයන් දෙකම අවසාන කර ඇත. ගරුමුණි වලව්වේ පැරණි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ හා එහි පරිසරය සුරැකෙන පරිදි සම්පූර්ණ සංරක්ෂණ ක්‍රියාවලියක් මේ වන විට යෝජනා කර ඇත. ඒ සඳහා සංරක්ෂණ සැලසුම් මොරටුව විශ්ව විද්‍යාලයේ සංරක්ෂණ ඒකකය මඟින් සිදු කෙරේ.

වයඹ සංස්කෘතික චතුරස්‍රය

වයඹ චතුරස්‍රයේ පළමු අදියර ලෙස යාපහුව ජනවාරි මාසයේදීද, දඹදෙණිය ජූලි මාසයේදී පඬුවස් නුවර සැප්තැම්බර් මාසයේදීද තිල වශයෙන් ආරම්භ කර ඇත. නමුත් යාපහුව හැර අනෙක් වැඩබිම් සඳහා අවශ්‍ය පමණ කම්කරුවන් සපයා ගැනීමට නොහැකි වූ බැවින් කැණීම් හෝ සංරක්ෂණ කාර්යයන් ආරම්භ කිරීමට නොහැකි විය.

යාපහුව වැඩබිම

කැණීම් හා පර්යේෂණ

බංගලාපිටිය ස්ථූපයේ පර්යේෂණ කැණීම අවසන් කරන ලදි. ඒ සමඟම බංගලාපිටිය පොකුණත්, පිට දිය අගලත් කැණීම් ආරම්භ කරන ලද අතර, ඒ සඳහා පුහුණු වන පුරාවිද්‍යා උපාධිධාරීන් ඍජුවම දායක කරගන්නා ලදි. අධික වර්ෂාව නිසා පොකුණේ කැණීම නොවැම්බර් මාසයේදී අත්හිට වීමට සිදුවිය.

සංරක්ෂණ හා භූ දර්ශන

ගල මුදුනට ප්‍රවිශ්ඨ වන ගල් පඩිපෙල සංරක්ෂණය 75% ක් අවසාන කිරීමට හැකි විය. කයිකාවල රජමහා විහාරයේ ප්‍රාකාරයේද ඉතා සුළු වැඩ කොටසක් පමණක් ඉතිරිව ඇත.

බිතුසිතුවම් සංරක්ෂණය ආරම්භ කළ කයිකාවල රජමහා විහාරයේත්, යාපහුව රජමහා විහාරයේත් එම කාර්යයන් අවසාන කිරීමට හැකි විය.

බටලීය කෞතුක වස්තු අනුරූ නිකේතනය හා පාසල

බටලීය පිහිටි අනුරූ පාසලෙහි පරමාරථය වන්නේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවක්, මධ්‍යම සංස්කෘතික අරමුදලත් කැණීම් මගින් සොයා ගන්නා හා මින් පෙර සොයාගත් විශිෂ්ඨ කලා නිර්මාණ හා පුරාවස්තු වල අනුරූ උසස් ප්‍රමිතීන්ට අනුව කර අලෙවි කිරීමයි.

මෙම පාසලේ චිත්‍ර, මූර්ති හා කැටයම් සඳහා දෑ අවුරුදු පාඨමාලා පවත්වන අතර, ඒ සඳහා කළුගල්, මැටි, පිඟන් මැටි, දැව හා ෆයිබර් කරන සිසුන් සඳහා ඩිප්ලෝමා සහතිකයක් පිරිනැමෙන අතර, ඔවුන්ට ස්වයං රැකියාවල නිරත වීමට දිරි දීමක් ද සිදුකෙරේ.

2009 / 2011 අධ්‍යයන වර්ෂයට අදාළ පාඨමාලා හැදෑරූ සිසුන් සඳහා අගෝස්තු මස සහතික පත්‍ර ප්‍රදානය කරන ලදි. මීට සමගාමීව එම සිසුන්ගේ නව නිර්මාණ හා අනුරූ නිර්මාණ ඇතුළත් ප්‍රදර්ශනයක් පවත්වන ලදි.

2011 වර්ෂයේ විශේෂ කාර්යයන්

- මහනුවර ජාත්‍යන්තර බෞද්ධ කෞතුකාගාරයේ ශ්‍රී ලංකා මැදිරිය සඳහා සියළුම අනුරූ සකස් කිරීම.
- ඉංජිනේරු හා පර්යේෂණ ආයතනය මගින් ඇණවුම් කළ බිසෝකොටුවක හරස් කඩ අනුරුව නිර්මාණය කර ජාතික කෞතුකාගාරයට භාර දී ඇත.
- බොරැල්ල විහාරයේ නව බුදු මැදුරේ චිත්‍ර ඇඳීම.
- ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ මෙතෙක් සේවය කළ විදුහල්පතිවරුන්ගේ උඩුකය ආලේඛ්‍ය මූර්ති 10 ක් සකස් කිරීම.
- ජනාධිපතිතුමා සාර්ක් සම්මේලනයට සහභාගී වන විට රැගෙන යාමට අවශ්‍ය වූ පොළොන්නරුව නිශ්ශංකමල්ල රාජසභා මණ්ඩපයේ සිංහරුව එම ප්‍රමාණයටම නිර්මාණය කිරීම.

2011 වර්ෂයේ අනුරූ අලෙවියෙන් ලද මුළු ආදායම රු. මිලියන 5.5 කි.

නෙළුම් පොකුණ රඟහල

මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් විශේෂ දායකත්වයක් දරන ලද නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහල ඉදිකිරීම් නිම වී මෙම වසරේ දෙසැම්බර් මස උත්සවාකාරයෙන් විවෘත කරන ලදි. නවීන රංගශාලා පහසුකම් සියල්ලම සපිරි මෙම රඟහලේ 1288 ක් සඳහා ආසන පහසුකම් ඇත.

ප්‍රකාශන අංශය හා මුද්‍රණාලය

මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රකාශන අංශය මඟින් වසරක් පාසා විවිධ ප්‍රකාශන පෝස්ටර්, අත්පත්‍රිකා, මාර්ගෝපදේශ සිතියම්, වාර්ෂික පර්යේෂණ ග්‍රන්ථ හා ළමා සාහිත්‍ය කෘති රාශියක් එළි දක්වනු ලැබේ. මීට අමතරව තොග අවසන් වූ සියළුම ප්‍රකාශන, අරමුදලේ කාර්යාලීය අවශ්‍යතා සඳහා ලිපි ශීර්ෂ ඇතුළු ලිපි ද්‍රව්‍ය ද මුද්‍රණය කෙරේ. අරමුදලට පරිබාහිර කතෘවරුන් විසින් සාහිත්‍ය, සංස්කෘතිය හා පාරම්පරික අස්පර්ශික උරුමය පිළිබඳ වූ කෘතීන් ද මුද්‍රණය කරදෙනු ලැබේ.

2011 වර්ෂයේ දී මුද්‍රණාලය මඟින් අරමුදලේ ප්‍රකාශන 53 ක්ද, බාහිර ආයතන සඳහා කාර්යයන් 30 ක්ද ඉටු කර ඇත. වසරේ මුද්‍රණාලය සඳහා වැය වූ මුදල රු. මිලියන 4.2 ක් වන අතර මුළු ආදායම රු. මිලියන 5.4 කි.

වසරේ ප්‍රකාශන අලෙවි ආදායම රු. මිලියන 9.77 කි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதித்திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல My No	ටීඑම්/ඒ/සීසීඑෆ්/ 2011/එෆ්ඒ/01	ඔබේ අංකය உமது இல Your No.		දිනය திகதி Date	2013 ජනවාරි 13 දින

අධ්‍යක්ෂ ජනරාල්,
මධ්‍යම සංස්කෘතික අරමුදල.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (4) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (4) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 <u>**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 <u>**විගණකගේ වගකීම**</u>

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ජේදයේ දැක්වෙන කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව	இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை	No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka
දුරකථනය தொலைபேசி Telephone. 2887028 -34	ෆැක්ස් අංකය பக்ஸ் இல Fax No. 2887223	ඉලෙක්ට්‍රොනික් තැපැල් ஈ- மெயில் E-mail. oaggov@sltnet.lk

1.4 **මතය ව්‍යාවනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වල ප්‍රතිඵලයක් ලෙස ආදායම් ප්‍රකාශනයේ , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංග වලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමට අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

02. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **විගණන මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ල.ගි.ප්‍ර.) වලට අනුකූල නොවීම්**

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී .ලං.ගි.ප්‍ර. 3	(i) මූල්‍ය ප්‍රකාශන සඳහා පාලක මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා නොතිබුණි.
		(ii) මූල්‍ය ප්‍රකාශන පෙර කාලපරිච්ඡේදය සමග සංසන්දනය කළ හැකි පරිදි ඉදිරිපත් කළයුතු වුවද, ඉදිරිපත් කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඒ අයුරින් පිළියෙල කර නොතිබුණි.
(ආ)	ශ්‍රී.ලං.ගි.ප්‍ර. 18	(i) එකතුව දළ වශයෙන් රු. මිලියන 82.50 ක් ලෙස ගණනය කළ හැකි ඉඩම් හා ගොඩනැගිලි විෂයයන් 3 ක් ඒවායේ සාධාරණ අගය නිශ්චය කොට ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) රක්ෂිත වටිනාකම රු.8,173,900 ක් වූ වාහන 21 ක වටිනාකම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) ක්ෂය කර අවසන්ව ඇති රු.138,538,297 ක් වටිනා පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමටත් භාවිතයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමටත් කටයුතු කර නොතිබුණි.

(iv) රු.21,422,365 ක් වටිනා ලී බඩු සවිකිරීම් හා කාර්යාල උපකරණ, පරිගණක හා උපාංග, යන්ත්‍ර උපකරණ සහ කොන්ත්‍රාත් උපකරණ ක්ෂය කර නොතිබුණි.

2.2.2 <u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අඩමාණ ණය වෙන් කිරීම සම්බන්ධයෙන් ආයතනය අනුගමනය කර තිබූ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන තුලින් හෙලිදරව් කර නොතිබූ අතර ඉකුත් වර්ෂයේ සිදුකළ වෙන් කිරීම් වූ රු.3,756,339 ක් මෙම වර්ෂයේද අඩමාණ ණය වෙන් කිරීම ලෙස ගිණුම් වල ඇතුලත් කර ණයගැතියන්ගෙන් අඩුකරනු වෙනුවට ලැබිය යුතු ශේෂ වලින් අඩුකර ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

(ආ) විවිධ තැන්පතු ලෙස වර්ෂ 5 කට අධික කාලයක සිට ගිණුම්වල පවත්වාගෙන එනු ලැබූ රු.3,461,463 ක් ආදායමට ගැනීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කර නොතිබුණි.

(ඇ) විශේෂ අරමුදල් ව්‍යාපෘති ලෙස ජංගම බැරකම් යටතේ වර්ෂ 4 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙනැවිත් තිබූ රු.18,426,279 ක් පෙර වර්ෂයේ ගැලපීම් මගින් සමුච්චිත අරමුදලට බැර කිරීම හා රු.4,537,224 ක් වෙනත් ආදායම් ලෙස වර්ෂයේ ආදායමට බැර කිරීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල සටහන් මගින් හෙලිදරව් කර නොතිබුණි.

(ඈ) විදේශීය ප්‍රදාන මත ලැබුණු සීගිරිය කෞතුකාගාරය ප්‍රාග්ධනිත කර ඒ සඳහා සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය වෙන් කිරීම රු.20,122,329 ක් ආදායම් වියදම් ගිණුම මගින් ගැලපීම් සිදු නොකර විදේශ සම්පත් අරමුදල් ගිණුම හර කර හා අදාල වත්කම් ගිණුම බැර කිරීම සිදුකර තිබුණි.

(ඇ) පුද්ගලික සමාගමකට ගෙවූ රු.1,382,055 ක අත්තිකාරම් මුදල අයකර ගැනීම සඳහා පවරා තිබූ නඩුව අවසන් කරමින් රු.4,472,151 ක් මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත ගෙවන ලෙස 2011 ජුනි 30 දින අධිකරණය විසින් නියෝග කර තිබුණද 2012 ඔක්තෝබර් 31 තෙක් එය අයකරගත නොහැකිව තිබුණි. මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශ තුළින් හෙළිදරව් කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.8,500,000 ක් වටිනා වාහනයක් රු.5,067,106 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතු කොටගෙන රු.3,432,894 ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) විදේශ අරමුදල් ව්‍යාපෘති 2 කින් අරමුදලට අයවිය යුතුව තිබූ එකතුව රු.1,631,478 ක මුදලක් 2011 වර්ෂයේ ලැබූ අරමුදල් වලින් හිලව් කර තිබුණු අතර එම ලැබීම් හා ගෙවීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) විශේෂ අරමුදල් ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබූ රු.15,610,824 ක් හා විශේෂ අරමුදල් ව්‍යාපෘති යටතේ වර්ෂය තුළ දරන ලද රු.36,823,600 ක වියදම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබූ අතර එකී ආදායම් හා වියදම් එකිනෙකට හිලව් කර ශේෂයන් පමණක් ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

(ඈ) රු.17,946 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය විවිධ ණයගැතියන් ලෙස සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල දක්වා තිබුණි.

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල වෙත ලබාදෙන ලද වර්ෂ 10 කට වඩා පැරණි නොපියවන ලද අත්තිකාරම් ශේෂ 28 කට අදාල රු.536,542 ක්ද, වර්ෂ 05 කට වඩා පැරණි අත්තිකාරම් ශේෂ 06 කට අදාල රු.660,859 ක්ද 2012 ඔක්තෝබර් 31 තෙක් නිරවුල් කර නොගෙන තවදුරටත් ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) ස්ථිර සේවකයන් 28 දෙනෙකුට අදාලව අයවීම් හිඟහිට තිබූ සේවක ණය ශේෂ එකතුව රු.1,257,003 ක් 2011 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 5 කට වඩා පැරණි වී තිබූ අතර, කම්කරු සේවකයන් වෙත ලබාදුන් රු.366,721 ක ආපදා ණය ශේෂයක් ද තවදුරටත් හිඟ හිටව පැවතුනි.

(ඇ) අයකර ගත නොහැකිව පවතින වසර 5 කට වඩා පැරණි උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂය රු.1,289,871 ක් තවදුරටත් අයකර ගත නොහැකිව ගිණුම් වල දක්වා තිබුණි.

(ඇ) වර්ෂ 2 - 28 ත් අතර කාල පරාසයක සිට පැවත එන එකතුව රු.1,658,005 ක් වූ ණයගැති ශේෂ 16 ක් ද, වර්ෂ 1 - 2 ත් අතර කාල පරාසයක සිට පැවත එන එකතුව රු.419,923 ක ණයගැති ශේෂද අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන ගිණුම් විෂයයන් සම්බන්ධව ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය.

විෂයය	වටිනාකම රු.	ඉදිරිපත් නොවූ සාක්ෂි
විශේෂ අරමුදල් ශේෂ	5,797,169	අරමුදල පිළිබඳ විස්තර ඇතුලත් ලිපිගොනු
ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය ව්‍යාපෘති කාර්යාල 10 ක බැංකු ජංගම ගිණුම් ශේෂ	2,400,324	ගිණුම් 6 ක ශේෂ සනාථ සහතික හා සියලු ශේෂයන්ගේ කාල විශ්ලේෂණ
විශේෂ අත්තිකාරම් හා උත්සව අත්තිකාරම්	1,289,871	උප ලේඛන
ව්‍යාපෘති වත්කම්	21,4[illegible],365	භාණ්ඩ සමීක්ෂණ වාර්තා
සේවක ණය - ආපදා	366,721	කාල විශ්ලේෂණ
ණයගැති ශේෂ 16 ක්	1,658,005	- එම -

දැයට කිරුළ වියදම්	8,723,975	ලදුපත්, බිල්පත්, ඉන්වෙන්ට්‍රි සහතික, ටෙන්ඩර් කැඳවීම්, කොන්ත්‍රාත් ගිවිසුම්
ඉඩම් හා ගොඩනැගිලි	325,250,000	ස්ථාවර වත්කම් ලේඛනය

2.2.6 **නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම්**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	නීති රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ)	ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 11.9 වගන්තිය	දේපල ණය ලබාගත් නිලධාරියාගේ පැවරුම් ඔප්පුව තමාට ඉදිරිපත් කළ වහාම දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඇටෝර්නි බලය පැවරීමේ ලියවිලි ලියාපදිංචි කර ආපසු එවීම සඳහා අදාල දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතු අතර, ණය මුදල නිදහස් කර සති 06 ක් ඇතුලත මෙම ක්‍රියාදාමය නිමකළ යුතුය. එසේ වුවත් නිලධාරීන් 78 දෙනෙකු වෙත ලබාදුන් අයවිය යුතුව තිබූ රු.15,568,564 ක දේපල ණය ශේෂයට අදාලව ඇටෝර්නි බලය ලියාපදිංචි කිරීම සඳහා 2011 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.
	මුදල් රෙගුලාසි	
(ආ)	371	(i) 2011 වර්ෂයේ පැවැත්වූ දැයට කිරුළ වැඩ සටහන වෙනුවෙන් අත්තිකාරම් ලෙස අරමුදල විසින් මොණරාගල දිස්ත්‍රික් ලේකම් වෙත රු.4,981,905 ක් ද, තණමල්විල දිස්ත්‍රික් ලේකම් වෙත රු.50,000 ක් හා නාට්‍ය ශිල්පියකු වෙත රු.400,000 ක් ද ගෙවා තිබූ අතර, 2011 දෙසැම්බර් 31 දින තෙක් එම අත්තිකාරම් පියවාගෙන නොතිබුණි.

මෙය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියක් බැවින් සියලු සැපයුම් හා සේවාවන් මහා භාණ්ඩාගාරයේ ප්‍රසම්පාදන මණ්ඩලයක් මගින් කරන ලද බවත් ගණන්දීමේ වගකීම ඔවුන් සතු බවත් දන්වා තිබුණි.

(ii) ප්‍රාදේශීය ව්‍යාපෘති වල වියදම් සඳහා ව්‍යාපෘති කාර්යාල 10 ක් වෙත ලබාදී තිබූ එකතුව රු.2,259,029 ක්වූ අතුරු අග්‍රිම ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පියවා නොතිබුණි.

(ඇ)	2006 මාර්තු 24 දිනැති අංක 128 දරන අයවැය චක්‍රලේඛය හා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ජේදය	වාර්ෂික ප්‍රසම්පාදන අවශ්‍යතාවයන් සඳහා ආයතනය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත්, ආයතනය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඈ)	2002 නොවැම්බර් 28 දිනැති අංක : IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	ස්ථාවර වත්කම් ලේඛනයක ආයතනයේ පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ තොරතුරු ඇතුලත් කළයුතු වුවත්, ඒ අයුරින් කටයුතු කර නොතිබුණි.

2.2.7 <u>ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

අභයගිරිය ව්‍යාපෘති පරිශ්‍රයේ තිබූ ස්ථූප ගඩොල් කැබලි 10550 ක් ව්‍යාපෘති කළමනාකරු විසින් තම අභිමතය පරිදි බාහිර පාර්ශවයන් වෙත නොමිලයේ නිකුත් කර තිබූ බවත්, එම ගඩොල් කැබලි වල වටිනාකම රු.2,008,500 ක් බවත් භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව නිරීක්ෂණය විය.

2.2.8 <u>මතභේදයට තුඩුදෙන ගනුදෙනු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වසර 3 සිට 11 ක කාලයක් තුල සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ සේවයට මුදාහැර තිබූ මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් 6 දෙනෙකුට සමාලෝචිත වර්ෂයට අදාලව අරමුදල විසින් ගෙවා ඇති දළ වැටුප් එකතුව රු.1,745,987 ක් විය. එමෙන්ම 2007 වර්ෂයේදී දකුණු පළාතේ ආයතනයක සේවය සඳහා මුදාහැර තිබූ මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවකයන් 3 දෙනෙකු වෙත 2011 වර්ෂය සඳහා අරමුදල විසින් ගෙවා තිබූ වැටුප් එකතුව රු.644,675 ක් විය.

(ආ) අරමුදලේ ප්‍රධාන කාර්යාලය පිහිටි භූමිය හා ගොඩනැගිලි වල වටිනාකම රු.20,932,071 ක් ලෙස ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර මූල්‍ය ප්‍රකාශන වලද එම වටිනාකම සඳහන් කර තිබුණද එම වත්කම් වල අයිතිය අරමුදල සතු නොවන බව හෙලිදරව් විය.

(ඇ) ඇතැම් ගැනුම්කරුවන් වෙත තොග වශයෙන් සංචාරක ප්‍රවේශපත් අලෙවි කිරීමේදී ඔවුන්ගෙන් චෙක්පත් ලබා ගැනීම හෝ බැංකුව වෙත සෘජුවම මුදල් බැර කිරීමට යොමු කිරීම වැනි ආරක්ෂිත ක්‍රම භාවිතා නොකර විශාල වටිනාකම් මුදලින් ලබාගෙන තිබුණි. 2011 දෙසැම්බර් 30 දින තුල පමණක් එසේ නිකුත් කර තිබූ ප්‍රවේශපත් වල වටිනාකම රු.5,191,100 ක් විය.

2.2.9 <u>අරමුණු වලට පටහැනි ගනුදෙනු</u>

සමාලෝචිත වර්ෂය තුල අරමුදල විසින් සිය අරමුණු වලට පටහැනි වන පහත වියදම් දරා තිබුණි.

(අ) ආදිවාසීන් මුහුණ පා ඇති ගැටළු හා ඔවුන්ගේ අවශ්‍යතා සොයා බැලීම සඳහා 2011 පෙබරවාරි 19 හා 20 දිනවල අමාත්‍යවරයකුගේ චාරිකාව සමග පවුල් 1,700 කට ආහාර පාර්සල් බෙදා හැරීම රු.1,777,307 කි.

(ආ) "ගිරුවාපත්තුවෙන් තල් අරුණට -තල් අරුණළු රුහුණු පුරට" වැඩ සටහනේ, පිරිත් සජ්ජායනය හා පාපැදි සවාරිය වෙනුවෙන් ගෙවා ඇති මුදල රු.300,000 .

03. <u>මූල්‍ය සමාලෝචනය</u>

3.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් වලින් රු.235,009,985 ක අතිරික්තයක් තිබූ අතර ඉකුත් වර්ෂය සඳහා ඊට අනුරූප අතිරික්තය වූ රු. 207,471,070 ක් හා සසඳන විට මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 27,538,915 ක වර්ධනයක් පෙන්නුම් කරයි. පෙර වර්ෂය හා සැසඳීමේදී සංචාරක ප්‍රවේශපත් අලෙවි ආදායම

රු.262,596,258 කින් වැඩිවී තිබුණද , අරමුදලේ මෙහෙයුම් වියදම් ද රු.212,605,561 කින් වැඩිවී තිබීම අතිරික්තයේ වැඩිවීම ප්‍රමාණාත්මක නොවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

සමාලෝචිත වර්ෂය තුල සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය වියදම වැඩිවීම රු. මිලියන 49.09 ක් හෙවත් ගිය වර්ෂයට සාපේක්ෂව 237 % ක් වී තිබූ අතර වෙනත් වියදම් වැඩිවීම රු. මිලියන 50.41 ක් හෙවත් ගිය වර්ෂයට සාපේක්ෂව 6788 % ක් වී තිබුණි. වැටුප් හා වේතන වැඩිවීම රු. මිලියන 54.53 ක් හෙවත් ගිය වර්ෂයට සාපේක්ෂව 10 % ක්වූ අතර දේපල හා යන්ත්‍ර උපකරණ ලියාහැරීම් වියදම රු. මිලියන 10 ක් හෙවත් ගිය වර්ෂයට සාපේක්ෂව 82 % කින් වැඩිවී තිබීම ද හේතුවෙන්, සංචාරක ප්‍රවේශපත් අලෙවි ආදායම රු. මිලියන 262.59 කින් හෙවත් 34 % කින් ඉහල ගොස් තිබුණද මෙහෙයුම් අතිරික්තයේ ප්‍රමාණාත්මක වැඩිවීමක් කෙරෙහි එය බලපා නොතිබුණි.

04. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 <u>කාර්ය සාධනය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ ප්‍රගති වාර්තාව අනුව කැණීම් වැඩබිම් 56 ක්ද, සංරක්ෂණ වැඩබිම් 85 ක්ද වශයෙන් මුළු වැඩබිම් 141 ක ඒකක 159201 ක වැඩ අවසන් කිරීමට සැලසුම් කර තිබුණද වැඩබිම් 19 ක වැඩ ඒකක 104890 ක් පමණක් අවසන් කර තිබුණි.

(ආ) 2011 වැඩ සැලැස්ම අනුව ජේතවන ව්‍යාපාතියෙහි බෝධිඝර සංරක්ෂණ, සංරක්ෂණ කාර්යාලය තුල අලුත්වැඩියා කිරීම් හා ජේතවන කාර්යාලයෙහි අලුත්වැඩියා කිරීම් වෙනුවෙන් පිරිවැය රු.2,342,251 ක් වූ වැඩ ඒකක 291 ක් නිම කිරීමට සැලසුම් කර තිබුණද එම කාර්යය වැඩ සැලැස්මෙන් ඉවත් කර තිබූ අතර එයට හේතු අනාවරණය නොවුණි.

(ඇ) අභයගිරිය ව්‍යාපෘතියෙහි මළුවේ ගඩොල් ඇතිරීම, ඇතුලත ප්‍රාකාරය සංරක්ෂණය හා මහා විහාරයේ විද්‍යාත්මක නඩත්තුව සඳහා රු.18,316,038 ක් පිරිවැය වූ වැඩ ඒකක 7941 ක්ද මහනුවර ව්‍යාපෘතියේ කන්දෙපිටිය රජමහා විහාරයෙහි සංරක්ෂණ කටයුතු සඳහා රු.725,085 ක් පිරිවැය වූ වැඩ ඒකක 172 ක්ද වර්ෂය තුලදී නිම කිරීමට සැලසුම් කර තිබුණද වර්ෂය තුලදී මෙම කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි.

(ඈ) ව්‍යාපෘති 07 ක මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.52,483,440 ක්වූ වැඩබිම් 18 ක් සඳහා 2011 වර්ෂය තුල නිම කිරීමට සැලසුම් කර තිබූ වැඩ ඒකක 19162 කින් 2011 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණේ වැඩ ඒකක 1897 ක් පමණක් වන අතර එහි මූල්‍ය කාර්ය සාධනය රු.5,195,780 ක් විය. මේ අනුව එම ව්‍යාපෘති වල 2011 දෙසැම්බර් 31 දිනට ලඟා කරගෙන තිබූ භෞතික හා මූල්‍ය කාර්ය සාධනය 10 % කටත් වඩා අඩු මට්ටමක පැවතුණි.

-

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු.409,064 ක ආපදා ණය ලබාගත් නිලධාරීන් 24 දෙනෙකු මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවයෙන් ඉවත්ව ගොස් ඇති අතර ඔවුන්ගේ ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දේපල ණය ලබාගත් නිලධාරියෙකුගේ රු.407,719 ක් වූ ණය ශේෂය 2005 වර්ෂයේ සිට කල් ඉකුත් වී ඇති අතර, එම ණය ශේෂය අයකර ගැනීම සඳහා ආයතනය විසින් මෙතෙක් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2005 වර්ෂයේ සිට සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත නිදහස් කර තිබූ අංක 32 - 4369 දරන ජීප් රථය 2011 වර්ෂය අවසානය තෙක් විධිමත් පරිදි මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අභයගිරිය චෛත්‍යයේ හතරැස් කොටුවේ සංරක්ෂණ කටයුතු වලට අවශ්‍ය රු.4,200,000 ක් වටිනා සංරක්ෂණ ගඩොල් 100,000 ක් සැපයීමේ කොන්ත්‍රාත්තුව ඉටු කිරීම පැහැර හැරි කොන්ත්‍රාත්කරුගේ කාර්ය සාධන බැඳුම්කරය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වර්ෂ ගණනාවක සිට බලපිටියේ පිහිටි ගරුමුණි වලව්ව පොත් ගබඩාවේ ගබඩා කර ඇති රු.9,381,498 ක පිරිවැය වූ විකිණීම සඳහා වන ප්‍රකාශන 68 ක පිටපත් 24735 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අලෙවි කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.3 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

අරමුදලේ ප්‍රාදේශීය ව්‍යාපෘති 2 ක වර්ෂ කීපයක සිට ප්‍රයෝජනයට නොගෙන පවතින ඉන්වෙන්ටරි භාණ්ඩ හා පාරිභෝජන භාණ්ඩ වර්ග 26 ක ඒකක 14503 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් තවදුරටත් නිෂ්කාර්යව පැවතුණි.

4.4 හඳුනාගන්නා ලද පාඩු

(අ) සීගිරිය උද්‍යානයේ ස්වයංක්‍රීය වතුර ඉසින ක්‍රම පද්ධතිය සැකසීම සඳහා 2000 වර්ෂයේදී පුද්ගලික සමාගමක් වෙත ගෙවන ලද රු.325,000 ක් වූ අත්තිකාරම් එම වර්ෂයේ සිටම නොපියවන ලද අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව අදාල සමාගම කටයුතු නොකිරීම මත අත්තිකාරම් බැඳුම්කර අවලංගුවීමට පෙර මුදල් අයකර නොගැනීම හේතුවෙන් මෙම නොපියවූ අත්තිකාරම් පැන නැගී තිබුණි.

(ආ) සංචාරක ප්‍රවේශපත් ආදායම වර්ධනය කර ගැනීමේ අරමුණින් 25 කට 1 ක් ලෙස දෙනු ලබන ප්‍රසාද ප්‍රවේශපත් වල වටිනාකම 2011 වර්ෂයේදී රු.35,883,472 ක් විය. 2011 වර්ෂය වන විට සංචාරකයින්ගේ පැමිණීම යහපත් වූ නිසා ප්‍රසාද ප්‍රවේශපත් නිකුත් කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගින හෙයින් රු. මිලියන 36 කට ආසන්න ආදායමක් අරමුදලට අහිමිවී තිබුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුදලේ ක්‍රියාකාරීත්වයට සෘජුවම බලපාන ජ්‍යෙෂ්ඨ තනතුරු 10 ක් සඳහා බඳවා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් ඇතැම් තනතුරු සඳහා වැඩ බැලීමේ පත්වීම් සිදුකර තිබුණි. තවද අවු: 1 සිට 9 දක්වා කාලයක් වැඩ බැලීමේ පත්වීම් දරන නිලධාරීන් 18 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.658,521 ක් වැඩබැලීමේ දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ආ) කාර්ය මණ්ඩලයේ අනුමත කම්කරු තනතුරු සංඛ්‍යාව 322 ක් වුවද 2011 දෙසැම්බර් 31 දිනට තථ්‍ය ස්ථිර කම්කරු සංඛ්‍යාව 811 ක්ව තිබියදී අනියම් හා තාවකාලික පදනම මත ද කම්කරුවන් 276 දෙනෙකු බඳවා ගෙන තිබුණි. ආයතනයේ අදහස් හා යෝජනා සැලකිල්ලට නොගෙන සේවක අවශ්‍යතා නිසි ලෙස හඳුනා නොගෙන විධිමත් නොවන පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන ඇති බව කළමනාකාරීත්වය දැනුම් දී ඇත.

05. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

අරමුදල විසින් 2005, 2008, 2009 හා 2010 වර්ෂවල වාර්ෂික වාර්තා 2012 ජුනි 30 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය

2011 වර්ෂය සඳහා ආයතනය විසින් සකස් කර තිබූ අයවැය ලේඛනය අනුව අපේක්ෂිත මූල්‍ය කාර්ය සාධනය සහ තථ්‍ය කාර්ය සාධනය 20 % සිට 224 % දක්වා පරාසයක් තුල විචලනය වී තිබූ බව නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය මනා මූල්‍ය පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය.

06. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ණයගැතියන්
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) විශේෂ අරමුදල් උපයෝජනය
(ඈ) මූල්‍ය පාලනය
(ඉ) ගිණුම්කරණය
(ඊ) සංචාරක ප්‍රවේශපත් මුද්‍රණය, තොග පාලනය හා ප්‍රසාද ප්‍රවේශපත් ඇතුළු අලෙවි කිරීම
(උ) ප්‍රාදේශීය කාර්යාලවල අග්‍රිම පාලනය

එච්.ඒ.එස්.සමරවීර,
විගණකාධිපති.

මධ්‍යම සංස්කෘතික අරමුදල
2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය

	2011	2010
	රු.	රු.
<u>වත්කම්</u>		
ජංගම වත්කම්		
මුදල් හා බැංකු	124,277,902	12,004,259
ලැබිය යුතු	16,787,112	5,101,933
තොගය	54,048,304	51,590,901
ආයෝජන	<u>50,000,000</u>	<u>25,000,000</u>
	245,113,318	**93,697,093**
ජංගම නොවන වත්කම්		
ලැබිය යුතු	141,484,821	46,003,273
විශේෂ ආධාර ව්‍යාපෘති	626,471	1,962,949
දේපළ යන්ත්‍ර හා උපකරණ	761,289,618	46,669,048
පාරිතෝෂික සදහා වෙන්කිරීම	<u>70,650,358</u>	<u>19,913,920</u>
	<u>974,051,268</u>	**<u>114,549,190</u>**
මුළු වත්කම්	**1,219,164,586**	**208,246,283**
<u>වගකීම්</u>		
ජංගම වගකීම්		
උපචිත ගෙවීම්	67,258,395	20,706,815
ජංගම නොවන වගකීම්		
පාරිතෝෂික සදහා වෙන්කිරීම	342,773,911	282,560,019
විශේෂ ආධාර ව්‍යාපෘති	11,868,619	60,446,100
විදේශ ආධාර ව්‍යාපෘති	<u>20,579,053</u>	<u>18,653,069</u>
මුළු වගකීම්	**<u>442,479,978</u>**	**<u>382,366,002</u>**
ශුද්ධ වත්කම්	**<u>776,684,608</u>**	**<u>(174,119,720)</u>**
ප්‍රාග්ධන දායකත්වය		
සමුච්චිත අරමුදල	19,944,705	19,944,705
සංචිත	16,064,386	16,064,386
වත්කම් ප්‍රත්‍යාගණන සංචිත	353,250,000	-
විදේශ ආධාර අරමුදල	344,118,064	-
සමුච්චිත අතිරික්ත/ඌනතා ගිණුම	<u>43,307,453</u>	<u>(210,128,811)</u>
	<u>776,684,608</u>	**<u>(174,119,720)</u>**

මධ්‍යම සංස්කෘතික අරමුදල
2011 දෙසැම්බර් 31 දින අවසන් වර්ෂය සඳහා
ආදායම් වියදම් විස්තරය

	2011	2010
	රු.	රු.
ආදායම්		
ප්‍රවේශ පත්‍ර අලෙවි ආදායම	1,027,218,619	764,622,361
අනුරූ අලෙවි ආදායම	(352,749)	4,101,207
ප්‍රකාශන අලෙවි ආදායම	2,502,878	7,798,592
මුද්‍රණාලයේ ආදායම	5,200,781	(632,783)
රජයේ අරමුදල් (භාණ්ඩාගාරයේ අරමුදල)	25,000,000	55,000,000
පරිත්‍යාග බරන ආයතන වලින් ලද ආදායම	2,163,936	1,891,403
ආයෝජන ආදායම	8,499,996	-
වෙනත් ආදායම්	20,805,766	8,409,647
	1,091,039,229	**841,190,427**
වියදම්		
වැටුප් වේතන හා සේවක දීමනා	602,331,975	547,795,233
පාරිතෝෂික	71,239,003	22,605,932
ස්ථාවර වත්කම් ක්ෂය	10,387,406	6,263,585
බොල්ණය හා ලැබීම් සඳහා වෙන්කිරීම	-	577,278
අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන්	5,686,198	1,881,588
සැපයීම් හා පාරිභෝජන ද්‍රව්‍ය භාවිතය	69,776,803	20,685,922
දේපළ පිරියත හා උපකරණ හානිවීම්	22,009,013	12,078,738
කොන්ත්‍රාත් සේවා	22,682,340	19,107,484
මූල්‍ය පිරිවැය	584,243	1,217,602
විගණක ගාස්තු	175,000	763,325
වෙනත් වියදම්	51,157,262	742,670
	856,029,244	**633,719,357**
වර්ෂය සඳහා අතිරික්තය / ඌණතාවය	**235,009,985**	**207,471,070**

මධ්‍යම සංස්කෘතික අරමුදල
2011 දෙසැම්බර් මස 31 වන දින අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

<u>මෙහෙයුම් අයිතමයන් වලින් උත්පාදනය වූ මුදල් ප්‍රභවය</u>

වසරේ ඌණතාවය		235,009,985
ගැලපීම් - මූල්‍ය නොවන අයිතම		
ක්ෂය වීම්	10,387,406	
පෙර වර්ෂය සඳහා ගැලපීම්	18,426,276	
ස්ථාවර වත්කම් විකිණීමේ අලාභ	(103,900)	
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	71,239,003	81,626,409
කාරක ප්‍රාග්ධන අයිතම ගැලපීමට පෙර මෙහෙයුම් ප්‍රතිඵල		334,958,773
<u>කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම්</u>		
ලැබිය යුතු	(95,481,548)	
තොග	(2,457,403)	
උපචිත ගෙවීම්	46,551,580	(51,387,371)
මෙහෙයුම් කටයුතු වලින් උත්පාදනය වූ ශුද්ධ මුදල් ප්‍රභවය		**283,571,402**
ආයෝජන කටයුතු මුදල් ප්‍රවාහය		
ස්ථාවර වත්කම් මිළදී ගැනීම	(27,639,912)	
ස්ථාවර වත්කම් ඉවත් කිරීම්	103,900	
ආයෝජන (වැඩිවීම/අඩුවීම)	(75,736,438)	
දිගුකාලීන ආයෝජන (වැඩිවීම/අඩුවීම)	(11,685,179)	
ආයෝජන කටයුතු වලින් උත්පාදනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(114,957,629)**
<u>මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහය</u>		
පාරිතෝෂික ගෙවීම්	(11,025,111)	
විශේෂ ආධාර ව්‍යාපෘති	(47,241,003)	
විදේශ ආධාර ව්‍යාපෘති	1,925,984	
මූල්‍ය අයිතමයන්ගේ මුදල් භාවිතය		**(56,340,130)**
ශුද්ධ මූල්‍ය වැඩිවීම - මුදල් හා මූල්‍ය සමාන අයිතම		**112,273,643**
වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන අයිතම		12,004,259
මුදල් හා මුදල් සමාන අයිතමයන්ගේ ශුද්ධ අඩුවීම		112,273,643
වසර අවසානයේ මුදල් හා මුදල් සමාන අයිතම		**124,277,902**

2011 දෙසැම්බර් 31 දිනට අවසන් වසර සඳහා ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

	සමුච්චිත අරමුදල	ප්‍රාග්ධන සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	විදේශ සංචිත අරමුදල්	සමුච්චිත අතිරික්තය	එකතුව
2011/01/01 දිනට ශේෂය	19,944,704.58	16,064,386.48	0.00	0.00	(210,128,810.67)	(174,119,719.61)
එකතු කළා :						
ප්‍රත්‍යාගණන අතිරික්තය			353,250,000.00			353,250,000.00
විදේශ අරමුදල්				402,446,592.34		402,446,592.34
වසර සඳහා අතිරික්තය					235,009,984.63	235,009,984.63
පෙර වසර ගැලපුම්					18,426,279.08	18,426,279.08
	19,944,704.58	16,064,386.48	353,250,000.00	402,446,592.34	43,307,453.04	835,013,136.44
අඩු කළා :						
ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන				(58,328,528.50)		(58,328,528.50)
2011/12/31 දිනට ශේෂය	19,944,704.58	16,064,386.48	353,250,000.00	344,118,063.84	43,307,453.04	893,341,664.94